# යම කාල බලි ශාන්ති කර්මයෙහි ඇති බෞද්ධාගමික, මනෝවිද්‍යාත්මක හා වාග්විද්‍යාත්මක වැදගත්කම

ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙණිය[1]

ආපෝ, තේජෝ, වායෝ, පඨවි සහ ආකාශ යන පඤ්ච මහා භූතයන් ගෙන් සැදුම් ලත් මානව ශරීරයෙහි වා, පිත්, සෙම් යන තුන් දොස් සහ සිත, කය, වචනය යන තුන් දොර මූලික ව මානසික හා කායික රෝග ඇති වේ. එලෙස ඇති වන රෝග නිවාරණය කරනු පිණිස පුරාණ ජන සමාජයේ බිහි වූ අෂ්ටාංග ආයුර්වේදය භූත විද්‍යාව, ජ්‍යෝතිෂය, යන්ත්‍ර මන්ත්‍ර හා ශාන්ති කර්ම පදනම් ව ගොඩනැගී ඇත. මෙකී සාම්ප්‍රදායික භූත විද්‍යාවෙහි එන යම කාල බලි ශාන්ති කර්මය යනු එලෙස දේශීය ජන සමාජයෙහි බිහි වූ උසස් බලි ශාන්ති කර්මයකි. මෙය පැවැත්වෙන්නේ ඉතා තදබල කායික හා මානසික රෝග සුව පත් කිරීම සඳහා ය. ග්‍රහයන්, දෙවියන්, යකුන් ආදි බලවේග විසින් ඇති කරනු ලබන දෝෂ හා රෝග දුරු කිරීම ද මෙහි එක් පරමාර්ථයකි. ආතුරයා වෙත පැමිණෙන දෝෂ ඉවත් කිරීම මෙහි ඇතුළත් වන චාරිත්‍ර වාරිත්‍ර මඟින් අපේක්ෂා කැරේ. මේ ශාන්ති කර්මයේ පවත්නා බෞද්ධාගමික අගය වන්නේ සිත, කය, වචනය මුල් ව රෝගී වූ ආතුරයාට ශීලයත් සමාධියත් ප්‍රඥාවත් ඇති වන ලෙස ශාන්ති කර්මය පැවැත්වීම යි. ශාන්ති කර්මය පවත්වන ඇදුරා ගේ ඇවැතුම් පැවැතුම් ආදියෙහි ලක්ෂණ සහ වත් පිළිවෙත් මඟින් ශීලයත්, ගායනය, වාදනය, තාලය, රිද්මය මෙන් ම රංග භාණ්ඩ සහ සැරැසිලි මඟින් සමාධියත්, ගායනා කරන ගද්‍ය පද්‍ය ආදියෙහි අර්ථ මඟින් ප්‍රඥාවත් ආතුරයා වෙත ළඟා කැරැවීමට සමත් වන බව පැහැදිලි ය. එසේ ම මෙහි ලා උපයුක්ත පූජා භාණ්ඩවල සහ ගද්‍ය පද්‍ය ආදියෙහි සුවිශේෂ වාග්විද්‍යාත්මක සන්නිවේදන අගයක් ද පවතී. ඒ අනුව මේ පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ යම කාල බලි ශාන්ති කර්මයෙහි ඇති බෞද්ධාගමික, මනෝවිද්‍යාත්මක හා වාග්විද්‍යාත්මක වැදගත්කම විමර්ශනය කිරීම යි.

**ප්‍රමුඛ පදඃ** යම කාල බලි ශාන්ති කර්මය, කායික-මානසික රෝග, බෞද්ධාගම, මනෝවිද්‍යාව, සන්නිවේදන අගය

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසඟිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය